# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,219—1960 ඔක්තෝබර් 28 වැනි සිකුරාදා—28.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඛ කරන ලදි)

## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 241 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | 247 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | 247 |
| අතුරු ව්‍යවස්ථා ... ... | 243 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 248 |

## පළාත් පාලන නිවේදන

ඇල්. ඕ.—බී. 139/46

ඇල්.ජී. ඕ.—ජී ජේ 23/1/1

### 1946 යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනත

1946 යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මුංවත්තේ බාගේ පත්තු ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අනුමත කර තිබේ. එකී වගන්තියේ (2) වැනි උප වගන්තියේ ප්‍රකාර එය මෙහි පළ කරනු ලැබේ.

**යෝජනාව**

1946 අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙම කාර්ය සභාව විසින් පාලන බල සීමාව ඇතුලත පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කර තිබෙන) විනෝද සඳහා ප්‍රවේශ වීම පිණිස අය කරනු ලබන ගෙවීම් පහත දැක්වෙන රේට් ගණන් අනුව බද්දක් පනවා අය කරනු ලැබේ.

| ගෙවන මුදල | බද්දේ රේට් ගණන රු. ශ. |
|---|---|
| බද්ද හැර ඇතුලත් වීමේ ගාස්තුව :— | |
| (අ) ශත 20 කට අඩු නොවන්නාවූ එහෙත් ශත 50 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 5 |
| (ආ) ශත 50 කට වැඩි වන්නාවූ එහෙත් රුපියලකට වැඩි නොවන්නාවූ විට ... ... | 0 10 |
| (ඇ) රුපියල් 1 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 1.50 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 15 |
| (ඈ) රුපියල් 1.50 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 2 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 20 |
| (ඉ) රුපියල් 2 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 3 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 30 |
| (ඊ) රුපියල් 3 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 4 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 40 |
| (උ) රුපියල් 4 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 5 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 50 |
| (ඌ) රුපියල් 5 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 10 කට වැඩි නොවන්නාවූ විට ... ... | 1 00 |
| (එ) රුපියල් 10 කට වැඩිවූ විට— | |
| (1) පළමුවැනි රුපියල් 10 ට ... ... | 1 00 |
| (2) ඊට වැඩිවූ එක් එක් රුපියල් 5 හෝ ඉන් කොටසකට ... ... | 1 00 |

වී. සී. ජයසූරිය.
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 ඔක්තෝබර් මස 20 දින,
කොළඹ දීය.

10-700

## ගම්සභා ආඥපනත් (198 වෙනි පරිච්ඡේදය)

### හබරාදූව ගම්කාය්‍යී සභාව

ගාලු දිස්ත්‍රික්කයේ හබරාදූව ගම්කාය්‍යී සභාව විසින් පහත සඳහන් යෝජනාව වර්ෂ 1960 ක්වූ ජූලි මස 30 වන දින රැස්වීමේදී සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දනුම් දෙනු ලැබේ.

ඩී. වයි. විජයවික්‍රම,
හබරාදූව ගම්කාය්‍යී සභාවේ සභාපති.

ගම්සභා කාය්‍යීාලය,
උණවටුන, 1960 සැප්තැම්බර් 13.

### යෝජනාව

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සහා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ, හබරාදූව ගම්කාය්‍යී සභාව විසින් 1958 සැප්තැම්බර් 19 වෙනි දින අංක 11,527 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරනලද යෝජනාවෙන්, සම්මත, කරගන්නාලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 4 වෙනි කාණ්ඩයේ (1) වෙනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනා කරනු ලැබේ.

| පාරේ අංකය | කොට්ඨාශයේ නම | පාරේ නම | දිග හැ. | දිග ද. | පළල අඩි |
|---|---|---|---|---|---|
| 1 | උණවටුන නැගෙනහිර | බංඩාරණායක මාවත පාර | — | 46 | 14 |
| 2 | උණවටුන බස්නාහිර | අන්දයන්වත්ත බොනවිස්ටා පාර | — | 66 | 16 |
| 3 | එම | කාඹරන්කගහ කන්දෙවත්ත පාර | — | 36 | 5 |
| 4 | එම | කාඹරන්කගහ අතුරු පාර | — | 20 | 3 |
| 5 | මැටරඹ I | ඇලතොට නාගොඩවත්ත පාර | — | 60 | 9 |
| 6 | එම | තල්කොටේ පාලම අරුබ්බන පාර | 1 | 40 | 12 |
| 7 | එම II | දලවැල්ල තල්පෙ අම්බලම පාර | 1 | 32 | 16 |
| 8 | එම | මිහිරිතැන්න ගස්ඇටකැල්ල පාර | — | 57 | 16 |
| 9 | එම | තල්පෙ උතුර තබන්ඇල පාර | — | 47 | 10 |
| 10 | පෙදින්නෝරුව | පිලාන යග්ගහ පාර | 1 | — | 14 |
| 11 | කලහෙ | කලහෙ පහලවත්තේ සිට හඳුගොඩ දක්වා පාර | — | 54 | 12 |
| 12 | එම | උණවටුන අත්තරකන්ද පාර | 1 | 3 | 8 |
| 13 | එම | කදුරුදූව එරමුදුගහ පාර | 1 | 40 | 8 |
| 14 | එම | ඇහලහේන පෙදින්නෝරුව පාර | 1 | 70 | 10 |
| 15 | එම | කලහෙ කොස්කඳගාව පිච්චිගෙවත්ත පාර | — | 68 | 10 |
| 16 | එම | ඊරියගහවත්ත පහලවත්ත පාර | — | 54 | 10 |
| 17 | පනාගමුව | වංචාවල පනාගමුව පාර | — | 40 | 12 |
| 18 | එම | කදුරුදූව පනාගමුව පාර | — | 52 | 12 |
| 19 | එම | වගහන්දූව නුගදූව කදුරුදූව පාර | 1 | 42 | 12 |
| 20 | එම | පනාගමුව අලුත්වත්ත යග්ගහ පාර | — | 45 | 10 |
| 21 | එම | අරඹෙවත්ත කෝන්ගොඩවත්ත පාර | — | 40 | 14 |
| 22 | එම | කලහෙ කොස්කඳගාව කෝන්ගොඩවත්ත පාර | — | 51 | 10 |
| 23 | තල්පෙ දකුණ | මිහිරිපැන්න එලුවිල පාර | — | 27 | 12 |
| 24 | එම | මිහිරිපැන්න දම්රුවන් මාවත පාර | — | 20 | 12 |
| 25 | පිටිදූව | පලටුගහ බෝදරගම පාර | — | 46 | 14 |
| 26 | එම | පිටිදූව පැලැන්පිටිගොඩ හීනටිගල පාර | — | 49 | 14 |
| 27 | එම | තනහේන පාලුවත්ත පාර | — | 41 | 8 |
| 28 | එම | මීපෙ හෝම්පලවත්ත බොරලුකැටිය පාර | — | 23 | 6 |
| 29 | දෙඩම්පෙ | ඇලතොට ගොයිපලාගොඩ පාර | — | 55 | 15 |
| 30 | එම | විද්‍යාකාන්ති පාර | — | 38 | 12 |
| 31 | එම | සිරි මේධානන්ද පාර | 1 | 18 | 12 |
| 32 | එම | දෙඩම්පෙ නාගස්ලග පිලානෙ හබරාදූව පාර | — | 51 | 12 |
| 33 | එම | හීනටිගල හන්දිය කලහෙ පාර | — | 68 | 12 |
| 34 | එම | හීනටිගල දෙකේ කනුව අරුබ්බන පාර | — | 31 | 3 |
| 35 | එම | සිරි ධර්මතිලක පාර | — | 34 | 10 |
| 36 | එම | අමරසිංහ මාවත පාර | — | 48 | 6 |
| 37 | එම | මැලෑගොඩ හීනටිගල පාර | 1 | 57 | 17 |
| 38 | ලියනගොඩ | කොග්ගල මාගල්තොට පාර | — | 60 | 12 |
| 39 | එම | කටුකුරුන්ද ධාර්මික පාර | — | 30 | 12 |
| 40 | එම | විහාරෙ පාර | — | 11 | 12 |
| 41 | එම | හින්නවැල්ලවත්ත රිලාදූව පාර | — | 31 | 14 |
| 42 | එම | කෝන්ගොඩවත්ත පොල්කන්ද පාර | — | 34 | 12 |
| 43 | හප්පාවන | මීපෙ පන්සල දෙලගාව හරුමල්ගොඩ පාර | — | 60 | 8 |
| 44 | එම | පිටිදූව හීනටිගල සූප්පුගෙවත්ත කුරුනෑගොඩ පාර | — | 29 | 12 |
| 45 | එම | හප්පාවන කොස්දූව පාර | — | 16 | 12 |
| 46 | එම | හප්පාවන පිලාන පාර | — | 46 | 8 |
| 47 | එම | හප්පාවන මත්තෙගොඩ පාර | 1 | 48 | 12 |

| පාරේ අංකය | කොට්ඨාශයේ නම | පාරේ නම | දිග හැ. | දිග ද. | පළල අඩි |
|---|---|---|---|---|---|
| 48 | හබරාදූව | හබරාදූව මාකඳුගොඩ පාර | — | 49 | 12 |
| 49 | පිලාන | පිලාන රජගෙදර පාර | — | 45 | 10 |
| 50 | එම | ලනුමෝදර අලුත් පාර | 1 | — | 10 |
| 51 | දෙරපෙ | කබරගල හල්ගස්මුල්ල පාර | — | 51 | 10 |
| 52 | එම | දන්ඩුවන පාලම බැදිපිට පාඨශාලාව දෙරපෙ කෝඹල පාර | — | 13 | 12 |
| 53 | එම | කබරගල පන්සල බැදිපිට පාඨශාලාව දක්වා පාර | — | 41 | 11 |
| 54 | අහුළුගහ | දෙරපෙ කෝඹල පාර | 2 | 26 | 13 |
| 55 | එම | දන්ඩුවන විලේවත්ත පාර | 1 | 23 | 14 |
| 56 | එම | දන්ඩුවන අහුළුගහ හන්දිය දක්වා පාර | — | 76 | 13 |
| 57 | එම | මත්තෙගොඩ නාරංඔවිට දෙරපෙ පාර | 1 | 27 | 16 |
| 58 | එම | අහුළුගහ පොල්හේන පාර | — | 70 | 3 |
| 59 | හියාරෙ | හල්ගස්මුල්ල දෙරපෙ පාර | — | 40 | 12 |
| 60 | එම | හියාරෙ වලවෙ පාර | 2 | 40 | 18 |
| 61 | එම | හියාරෙ පැලවත්ත කැන්දගහවත්ත පාර | 1 | 60 | 17 |
| 62 | එම | මහවෙල උඩින් හියාරෙ දක්වා පාර | 2 | — | 11 |
| 63 | එම | ගොනාමුල්ල කැකිරිහේන පාර | — | 20 | 17 |
| 64 | එම | වැරල්ලාන අරඹෙවත්ත පාර | 1 | 20 | 15 |
| 65 | එම | හියාරෙ අටහවුල උඩින් උඩුම්ටිය පාර | 1 | — | 14 |
| 66 | එම | හියාරෙ අරඹෙවත්ත අටහවුල පාර | 1 | — | 10 |
| 67 | එම | පැලකැටියවත්ත මීදල්ලදෙල පාර | — | 40 | 12 |
| 68 | එම | ගරාවිල දෙනිය පාර | — | 60 | 15 |
| 69 | එම | හියාරෙ දෙලබොඩ පාර | — | 60 | 15 |
| 70 | හරුමල්ගොඩ | බෝගහවත්ත කුරුඳුවත්ත පාර | — | 30 | 15 |
| 71 | එම | බෝගහවත්ත කොග්ගලඔය පාර | — | 43 | 12 |
| 72 | එම | මීපෙ හරුමල්ගොඩ පාර | — | 37 | 10 |
| 73 | එම | මීපෙ අම්පිටිය වල්පිටිගොඩ පාර | — | 23 | 15 |
| 74 | එම | හරුමල්ගොඩ කොග්ගලඔය පාර | — | 33 | 12 |
| 75 | එම | හරුමල්ගොඩ ඉඳිගහලවත්ත මුතුගල්තුඩුව පාර | — | 60 | 14 |
| 76 | එම | හරුමල්ගොඩ ජුල්ගහ හන්දිය කොග්ගලඔය පාර | — | 40 | 14 |

10-785

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඞී—ඞී. 54/52

ඇල්. ජී. ඞී—ජී ජේ 9/23

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ මැද පත්තුවේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින 9,773 දරණ ගැසට් අතිරේකයේ පලවූ ප්‍රකාශයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථාවර ලේකම් තැන.

1960 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ මැද පත්තුවේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1955 ගේ සැප්තැම්බර් මස 9 වැනි දින අංක 10,837 දරණ ගැසට් පත්‍රයේ පළකරවන ලද රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා, එහි " බී " උපලේඛනය අස්කොට ඒ වෙනුවට මෙහි පහත සඳහන් උපලේඛණය යෙදීමෙන් මෙයින් සංශොධනය කරනු ලැබේ.

### " බී " උපලේඛනය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින්රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අශ්වමක වාහනයක් සඳහා | කුරු. මැ. වා. |
| සෑම ගොන්දෙන්නා බඳින බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | කුරු. මැ. ක. |
| සෑම තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | කුරු. මැ. බා. |
| සෑම අත්කරත්තයක් සඳහා | කුරු. මැ. අ. |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා | කුරු. මැ. ජි. |
| සෑම බයිසිකලයක් සඳහා | කුරු. මැ. බ." |

10-687

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ නාගොඩ ගම් ප්‍රදේශයේ නාගොඩ ගම් කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද එකී වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර
ලේකම් තැන.

1960. 10. 18 දින,
කොළඹදී, ය.

### ආයුර්වේද බෙහෙත් ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදය) 43 (බීබී) වැනි වගන්තිය යටතේ ගම්කාර්ය සභාව විසින් ගම් ප්‍රදේශයේ පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලා කාර්ය සභාව විසින්ම නඩත්තු කළ යුතුවාත් හැර 1941 කේ අංක 17 දරණ ස්වදේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ ආඥාපණත යටතේ ලියා පදිංචි කරන ලද සවදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයෙකු භාරයේ තැබිය යුතුද වන්නේ ය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයෙකු විසින් හෝ කාර්ය සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කිසියම් නිලධාරියකු විසින් හෝ කාර්ය සභාව විසින් නියම කරණු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව සම්බන්ධයෙන් වූ ගණන් හිලවු පිළිබඳ යම් යම් පොත් පත් හා වෙනත් එබඳු ස්ථානද කාර්ය සභාව විසින් අනුමත කරණු ලබන යම් පිළිවෙලකට හා යම් විදියකට අනුව තැබිය යුතු වන්නේ ය.

3. කාර්ය සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් ගම්කාර්ය සභා පොදු අරමුදලෙන් අවුරුදු පතා ලබාගෙන පරිහරණය කළහැකි අතර එසේ පරිහරණය කිරීම සඳහා කාර්ය සභාවේ වාර්ෂික අය වැය ලේඛනයෙන් හෝ වරින් වර කාර්ය සභාව විසින් සම්මත කරගනු ලබන අතිරේක ඇස්තමේන්තුවලින් මුදල් වෙන් කළ යුතුද වන්නේ ය.

4. 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට යටත්ව ආයුර්වේද බෙහෙත් ශාලාවේ රෝගීන්ට ප්‍රතිකාර නොමිලයේ සැපයිය යුතුවත් හැර, එකී ප්‍රතිකාර නාගොඩ ගම් ප්‍රදේශයේ පදිංචි කරුවන්ට සීමාවිය යුතුද වන්නේ ය.

5. ආයුර්වේද බෙහෙත් ශාලාවක ප්‍රතිකාර කරන රෝගියකුට කිසියම් බෙහෙතක් හෝ ඖෂධයක් හෝ සපයනු ලබන කල්හි එකී රෝගියාගෙන් ශත 50 ක ගාස්තුවක් අය කිරීමට කාර්ය සභාවට හැකිය. සභාපතිතුමා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් හෝ කාර්ය සභාව විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රයකින් රෝගියකුගෙන් අය කරණු ලබන එකී සෑම ගාස්තුවක් සම්බන්ධයෙන්ම වහාම කුවිතාන්සියක් නිකුත් කළයුතු වන්නේ ය. එකී සෑම කුවිතාන්සියකම කාබන් අනු පිටපතක් තිබිය යුතුවාත් හැර ඒවායේ පිළිවෙළින් අංක යොදා තිබිය යුතුද වන්නේ ය.

6. සභාපතිතුමා විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත්කම නිසා 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් ඕනෑම රෝගියකු නිදහස් කළ හැකි වන්නේ ය.

7. සභාපතිතුමා විසින් දෙසැම්බර් මාසයේ 31 වැනිදායින් අන්තිම වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව පිණිස ලැබෙන මුදල් හා ඒ සම්බන්ධයෙන් වියපැහැදම් වන මුදල් ද පෙන්නුම් කරන සටහනක් සම්පාදනය කිරීමට සැලැස්විය යුතු වන්නේ ය.

8. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ආයුර්වේද බෙහෙත් ශාලාව" යනුවෙන් කාර්ය සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් කරනු ලැබේ ;

"සභාපතිතුමා" යනුවෙන් කාර්ය සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ ;

"කාර්යසභාව" යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ ;

"ගම් ප්‍රදේශය" යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ නාගොඩ ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

10-699

---

LD—B. 121/50
L.G.D.—GJ 9/18/2

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ මැදපත්තුව ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹදීය.

**රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා**

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙක් අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත දැක්වෙන "ඒ" උපලේඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාර විස්තර උපලෙඛනයක් ප්‍රධානතුමාට සැපයිය යුතුයි. මේ පෝර්ම ගම්කාර්‍ය සභා කාර්‍යාලයෙන් ලබාගත හැකිය.

(2) අඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1960 වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණකොට 1960 ඔක්තෝබර් මස 31 වැනි දින හෝ ඊට මත්තෙන් හෝ ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය විසින් ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලෙඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලෙඛන සැපයුවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව :—

(අ) ඒ උපලෙඛනයේ සඳහන් රථවාහන සහ සතුන් සඳහාවූ බද්ද 1960 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ ඔක්තෝබර් මස 31 වනදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලෙඛනයේ සඳහන් කරන ලදුව, එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන සහ සතුන් සඳහාවූ බද්ද එකී එක් එක් අවුරුද්දේ ඔක්තෝබර් 31 වනදා හෝ ඊට මත්තෙන් ගෙවීමට යටත් වෙති.

3. වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලෙඛනය සැපයුවාට පසු යම්කිසිවකු විසින් ඒ උපලෙඛනයේ සඳහන් නොකෙරෙන ලද්දාවූ ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලෙඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවකු විසින් එකී බද්දට යටත්වන යම් රථවාහනයක් හෝ සතෙකු පළමු වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත්කර ගැනීමේ හෝ තබාගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලෙඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධානතුමාට දැනුම්දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම එකී ලෙඛනය සැපයු අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලෙඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයේ පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. 1 (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළා වූ හෝ උප ලේඛනයේ සඳහන් කළා වු හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් හේතු නිසා යයි දැක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයූවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීමට හෝ පාවිච්චි කිරීම නතර කළා වූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත් හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත් හළ බැව් වහාම ප්‍රධානතුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6.(1) යම් කිසිවෙකු විසින් යම් කිසි රථවාහනයක් සඳහා බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් "බී" උපලෙඛනයෙහි සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ඒ රථ වාහනය සඳහා වෙන් වශයෙන් යොදා ඇති විශෙෂ අකුරුද තහඩුව නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම්ද රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහන පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ

නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් ඒ ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අලුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බව දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්වුව හොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම් පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකියි.

7. සෑම රථවාහනයකම එම අවසථාවේ අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවසථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ කාය්‍යී සභාවේ ආදායම් ඕවර්සියර්වරයා විසින් හෝ පොලිස් නිලධාරියෙකු හෝ ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් වෙනත් ඕනෑම නිලධාරියකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ද ඒ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවසථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නිත්‍යානුකූල වන්නේ ය. තවද ප්‍රධානතුමා විසින් හෝ එබඳු වෙනත් නිලධාරියා විසින් හෝ ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක එම අවසථාවේදී භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩදිය යුතුයි.

9. මේ අතුරු ව්‍යවසථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාය්‍යී සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාය්‍යීසභාව" යනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ මැදපත්තුව ගම් ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව අදහස් කරනු ලැබේ;

"ආඥපනත" යනුවෙන් ගම්සභා ආඥපනත අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### (ෆෝර්මය)

රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව.

රථ වාහන හා සතුන් පිළිබඳ අතුරු ව්‍යවසථාවල ප්‍රකාර සැපයිය යුතු රථවාහන හා/හෝ සතුන් පිළිබඳ උපලේඛනය.

අයිතිකරුගේ නම :————.

ඡන්ද දායක කොට්ඨාශය :————.

ගම :————.

| රථවාහන හා* හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන වචන වලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින්රික්ෂෝ කරත්තවලට බාහිර වශයෙන් වූ වෙනත් ඕනෑම අන්දමක රථ වාහන ... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල තනිගොනා බඳින බරබාග කරත්ත හෝ/තිරික්කල අත් කරත්ත | | |
| ජින් රික්ෂෝ රථ ... | | |
| බයිසිකල් (වෙනත් කරුණු සඳහා සපයා ඇති තීරුවේ සාදන ලද අයගේ අංකය සඳහන් කරන්න.) | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

ඉහත සඳහන් විස්තර සෑම අතින්ම සත්‍ය බවත්, නිවැරදි බවත්, මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයිතිකරුගේ අත්සන.

දිනය :————.

## "බී" උපලේඛනය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින්රික්ෂෝ කරත්තයක් හැර වෙන ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... ... | න. මැ. වා. |
| ඕනෑම අන්දමක සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | න. මැ. බ. ක. |
| සෑම තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | න. මැ. ක. |
| සෑම ජින්රික්ෂෝ කරත්තයක් සහ සෑම අත් කරත්තයක් සඳහා ... ... | න. මැ. අ. ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | න. මැ. බ. |

*නුවුවමනා වචන කපාදමන්න.

10-719

---

ඇල්.ඩී.—බී. 121/50/ඇල්.ජී.ඩී—ජීජේ 9/18/2.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ මැද පත්තුව ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවසථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථාවර ලේකම් තැන.

1960 ඔක්තෝබර මස 14 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවසථා

### ගොඩනැගිලි සහ මායිම් තාප්ප

1. කිසිවකු විසින් ගම් ප්‍රදේශය ඇතුළත—

(අ) ඕනෑම ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණය ඇතුළත,

(ආ) යථා කාලයේ දී ගම්බද කරත්ත පාරක් බවට පත් කරනු ලැබිය හැකි යයි කාය්‍යී සභාව විසින් දැනුම් දෙනු ලැබුවා වූ ඕනෑම ගම්බද මාවතක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණය ඇතුළත, හෝ

(ඇ) මේ අතුරු ව්‍යවසථාවේ (ආ) උප ඡේදයේ සඳහන් කරන ලද මාවතකින් බාහිර වූ ඕනෑම ගම්බද මාවතක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත හෝ කිසියම් අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

2. අඩු ගණනේ දවස් තිහකටවත් කලින් ඒ පිළිබඳව ලියවිල්ලකින්වූ දැන්වීමක් ප්‍රධානතුමාට භාර නොකර කිසිවකු විසින් (1) අතුරු ව්‍යවසථාවේ සඳහන් කරන ලද යම් කරත්ත පාරක් හෝ මාවතක් අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් නො සෑදිය යුතුයි.

### දඩාවතේ යන ගවයන්

3. කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවසථාවල 24 වැනි කාණ්ඩයේ 3 වැනි අතුරු ව්‍යවසථාවේ (1) වැනි ඡේදය යටතේ දඩාවතේ යන සතුන් දමන කොටුවේ දමන ලද යම් සතකු ඉන් ඉවත් කර ගෙන යාමට මත්තෙන් අයකළ යුතු වූ ගාස්තුව පහත දැක්වෙන සේ ගණන් බලා අයකළ යුතුයි:—

(අ) සතුන් දමන කොටුවට ඇතුල් කළ එක් සතකුට රුපියල් හතරකි.

(ආ) ඉහත සඳහන් අය කිරීමට අමතර වශයෙන් (1) එක් රැයක් සඳහා සතුන් දමන කොටුවෙහි දමන ලද එක් සතෙකුට රුපියල් තුනකි. (2) දහවල් කාලයේ දමන කොටුවෙහි තබන එක් එක් පැය හයකට එක් සතකුට රුපියල් එකයි සත පනහකි.

### මහජන හිරිහැර අඩුකිරීම

4. ගම්ප්‍රදේශය තුළ කිසිවකු විසින් යම් ග්‍රැමපෝන් යන්ත්‍රයක් හෝ ගුවන් විදුලි යන්ත්‍රයක් හෝ ශබ්ද වාහිණී යන්ත්‍රයක් හෝ වෙනත් එබඳු යන්ත්‍රයක් ක්‍රියාකරවීමෙන් හෝ ක්‍රියා කරවීමට සැලැස්වීමෙන් වෙනත් කෙනෙකුට ක්‍රියා කරවීමට ඉඩදීමෙන් අහල පහල පිහිටි ඉඩම්වල පදිංචි කාරයින්ට කන්දෙස්ක්‍රියාවක් සිදුවන පරිද්දෙන් අධික ලෙස හෝ නැවත නැවතත් හෝ තොරතෝංචියක් නැතිව හෝ යම් ශබ්දයක් ඇති කිරීම හෝ නැවත උපදවීම හෝ ඇතිකිරීමට හෝ නැවත උපදවීමට සැලැස්වීම හෝ නොකට යුතුයි.

5. යම්කිසි වීථියක්, පොදු ස්ථානයක්, කඩයක් හෝ වෙළඳාම කරන ස්ථානයක හෝ මහාජනයා පැමිණෙන්නාවූ යම් වීථියක් හෝ පොදු ස්ථානයක් අසල පිහිටියාවූ යම් ස්ථානයක් සහ එකී ස්ථාන වලින් බාහිරවූ යම් ස්ථානයක ඉහත සඳහන් පරිදි යම් යන්ත්‍රයක් ක්‍රියා කරවන්නාවූ හෝ ක්‍රියා කරවීමට සලස්වන්නාවූ හෝ වෙනත් කෙනෙකුට ක්‍රියා කරවීමට ඉඩ දෙන්නාවූ යම් කිසිවෙකුට විරුද්ධව—

(අ) එය කන්දෙස්ක්‍රියාවක්ය කියා ඒ අසල පිහිටි ගෙවල්වල පදිංචිව සිටින ගෘහ මූලිකයන් තුන්දෙනෙකුට නො අඩු ගණනක් විසින් ඒ බව ලියවිල්ලකින් ප්‍රධානතුමාට පැමිණිලි කරනු ලැබද,

(ආ) ප්‍රධානතුමා විසින් තමාට ලැබුණු පැමිණිලිවල ස්වභාවයන් දක්වා ලියවිල්ලක් ඒ අයට භාරකොට වහාම හෝ නියමිත කාලසීමාවක් ඇතුළත දී හෝ ඒ කන්දෙස්ක්‍රියාව අඩුකළ යුතුයයි නිවේදනයක් කරනු ලැබ, හා

(ඉ) කාරණයේ හැටියට ඒ දන්වීම ලැබුන හැටියේම හෝ එහි සඳහන් කාලසීමාව ඇතුළත දී හෝ ඒ අය විසින් එහි දක්වෙන නියමයන් ඉෂ්ට නොකර හෝ ඉෂ්ට කිරීම පැහැර හැර තිබේනම් මිස නැතිනම් 4 වැනි ව්‍යවස්ථාව යටතේ නඩු පැවරිය යුතු නැත.

### නිලධාරීන් හා මෙහෙකරුවන්

6. කායිකි සභාවට ලැබිය යුතු සියළුම අයබදු හා ගාස්තු එකතු කොට කාර්ය සභාවේ මුද්‍රාව හා ප්‍රධාන තුමාගේ අත්සන නිවැරදි පිටපත ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස ප්‍රධානතුමා විසින් ඕනෑම නිලධාරියෙකුට හෝ වෙනත් කෙනකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

7. කිසිවකු විසින්—

(ඒ) ගම්සභා ආඥාපනතෙන් හෝ ඒ ආඥාපනතේ හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවල හෝ යම් විධි විධානයක් යටතේ හෝ ප්‍රධාන තුමාට හෝ කායිකි සභාවේ වෙනත් යම් නිලධාරියෙකුට පවරා ඇති යම් බලයක් පාවිච්චි කිරීමේදී හෝ පනවා ඇති යම් යුතුකමක් ඉටු කිරීමේදී හෝ නියම කොට ඇති යම් කාර්යයක් ක්‍රියාවේ යෙදවීමේ දී එකී ප්‍රධානතුමාට හෝ නිලධාරියාට ; හෝ

(බී) කාර්ය සභාවෙන් හෝ සභාව වෙනුවෙන් රක්ෂාවට යොදා ගන්නා ලද යම් මෙහෙකරුවෙකුට හෝ වැඩ කරුවෙකුට ප්‍රධානතුමා විසින් හෝ කායිකි සභාවේ වෙනත් යම් නිලධාරියෙකු විසින් හෝ නීති ප්‍රකාර පවරා තිබෙන යම් යුතුකමක් ඉෂ්ට කිරීමේ දී ඒ මෙහෙකරුවාට හෝ වැඩකරුවාට හෝ ඕනෑකමින් බාධා නො කළ යුතුයි.

8. මේ අතුරු ව්‍යවස්ථාවල—

" ප්‍රධානතුමා " යනුවෙන් කායිකි සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ ;

" කායිකිසභාව " යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කායිකි සභාව අදහස් කරනු ලැබේ ;

" ආඥාපනත " යනුවෙන් ගම්සභා ආඥාපනත අදහස් කරනු ලැබේ ;

" ගම් ප්‍රදේශය " යනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ නවදූන් කෝරළේ මැදපත්තුව ගම්ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

10-719

---

ඇල්. ජී. ඞී.—ජීසී. 14/42

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ ඕතර පලාත ගම් ප්‍රදේශයේ ගම්කායිකි සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ, එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්.

1960 ඔක්තෝබර් 18 දින, කොළඹ දීය.

**අන්තරාදායකවූ හා අප්‍රසන්නවූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. අන්තරාදායක වූ හා අප්‍රසන්න වූ කර්මාන්ත—

(1) කොප්පරා ගබඩා කිරීම.

(2) කොප්පරා සෑදීම.

(3) කබොක්, කළුගල් හෝ බොරළු ලබා ගැනීමට වළවල් කැපීම.

(4) මිණිරන් වියළීම හෝ ගබඩා කිරීම.

(5) වළක් කැනීමෙන් හුනුගල් ලබා ගැනීම.

(6) වී මෝලක් හෝ හාල් පාහින යන්ත්‍රයක් තබා ගැනීම.

(7) යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම.

(8) දර හෝ ලී මඩුවක් තබා ගැනීම.

(9) කෙඳි වගී තෙලීම හෝ ගබඩා කිරීම.

(10) කපු පුළුන්, නූල් ගබඩා කිරීම.

(11) පිදුරු ගබඩා කිරීම.

(12) බූමිතෙල් ගබඩාවක් තබා ගැනීම.

(13) මුද්‍රණාලයක් තබා ගැනීම.

(14) කපාපු පොල් සකස් කිරීම.

(15) අම්ලකර වායුව පාවිච්චිකරන කම්හලක් තබා ගැනීම.

2. පහත සඳහන් කර්මාන්ත අප්‍රසන්න කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.

(2) තොග ගණනේ විකිණීම සඳහා නරක් විය හැකි ආහාර සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.

(3) කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම.

(4) ඩිනාකිරි සෑදීම.

(5) සබන් සෑදීම.

(6) දුම්කොළ වියළීම හෝ සකස් කිරීම.

(7) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම.

(8) පුවක් වේලා සකස් කිරීම.

(9) සතුන්ගේ ලේ හෝ මළ කුණු උණු කිරීම නොහොත් සත්ව තෙල් පෙරීම.

(10) සතුන්ගේ හම් ගබඩා කිරීම.

(11) සතුන්ගේ ඇට ගබඩා කිරීම.

(12) මාළු අසිස් දැමීම.

(13) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම.

(14) ලැලි පොඟවා සකස් කිරීම.

(15) පැණි හකුරු සෑදීම.

(16) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා තබා ගැනීම.

(17) කෝඩා සෑදීම.

(18) සුරුට්ටු හෝ බීඩි සෑදීම.

3. පහත දක්වෙන කර්මාන්ත අන්තරාදායක සහ අප්‍රසන්න වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කෙඳි වගී සායම් කිරීම.

(2) ගඩොල් පිළිස්සීම.

(3) උළු පිළිස්සීම.

(4) හුණු ගල් පිළිස්සීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම.

10-773

# අය වැය ලේඛන

මගේ අංකය : ඒ/57.

## මහරගම උප නගර සභාව

**මුදල් පරිහරන නීති පොතේ අංක : 40(2) යටතේ අයදුම්පත වර්ෂ 1960ටේ අය–වැය කෙටුම්පත**

1 වෙනි කොටස (සාමාන්‍ය අංශය)

ශීර්ෂවල ඉතිරි වී ඇති මුදල් ඒ ප්‍රමාණ අනුවම වැඩි වී ඇති ශීර්ෂවලට යෙදීමට වර්ෂ 1960 ජූනි මස 11 වෙනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී පහත සඳහන් අන්දමට සභා සම්මත කරගන්නා ලදී:

ඉතිරිකරගත් ශීර්ෂ—

| | | රු. ශ. |
|---|---|---|
| බී/2 | නඩත්තුව ... ... | 5,000 00 |
| බී/7 | ඉඩම් ලබාගැනීම ... ... | 6,195 00 |
| | | 11,195 00 |

වැඩිවී ඇති ශීර්ෂ—

| | | රු. ශ. |
|---|---|---|
| ඒ/1(බී) | ලිපිකරු මණ්ඩලය ... ... | 4,500 0 |
| ඒ1(සී) | ආදායම් ඕවර්සියර් ... ... | 75 0 |
| ඒ1(ජී) | ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර මුදල් ... | 5,248 0 |
| ඒ2(ඒ) | දීමනා ... ... ... | 372 0 |
| ඒ2(ඇෆ්) | ලිපි ද්‍රව්‍ය යනාදිය ... | 1,000 0 |
| | | 11,195 0 |

ඩී. එල්. පතිරගෙ,
සභාපති.
මහරගම උප නගර සභාව.

1960 ජූනි මස 27 වෙනි දින,
උප නගර සභා කාර්යාලයය,
පරණ පාර, නාවින්න.

අනුමත කරමි.

ඇස්. සුන්දරමූර්ති,
පළාත් පාලන කොමසාරිස් වෙනුවට.

පළාත් පාලන කොමසාරිස් කාර්යාලයය,
කොළඹ.
වර්ෂ 1960 ඔක්තෝබර් මස 16 වෙනි දින.

10–625

# දේපල විකිණීම

## පොල්ගහවෙල සුළු නගර සභාව

**1958 වර්ෂය වෙනුවෙන් නොගෙවූ වරිපනම් ගාස්තු සඳහා දේපල විකිණීම**

තහනම් කිරීම සඳහා චංචල දේපල් නැති හෙයින් 1958 පළමුවෙනි කාර්තුවේ සිට 1958 හතරවෙනි කාර්තුවේ අවසානය තෙක්, පහත සඳහන් උප ලේඛනයෙහි දක්වෙන ස්ථානවලින් ලැබිය යුතු හිඟ වරිපනම් සම්බන්ධයෙන් 1946 අංක 3 දරණ සුළු නගර සභා ආඥපනතේ 179 සහ 183(1) ඡෙදවලින් කියැවෙන පරිදි, 1947 අංක 29 දරණ නගර සභා ආඥපනතේ 252 සහ 256 ඡෙද අනුව පොල්ගහවෙල සුළු නගර සභාවේ සභාපති තැන විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුලිය සහ ලාභ, (2) ලී දඬු සහ උපදින ද්‍රව්‍ය (3) ගෙයි උපකරණ සහ (4) පහත සඳහන් දේපලක්ම ඒවා වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් ගාස්තු යථා කාලයෙහි ගෙවනු නොලැබුවහොත් ඒවා එම ස්ථානවලදීම පූ.භා. 9.30ට පටන්ගෙන ඒ ඒ දිනවල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

උප ලේඛනයෙහි ගැසට් කරන ලද විකිණීම් සඳහා දක්වෙන දේපල පිළිබඳ මුදල් ගෙවා ඇතිනම් එම කුවිතාන්සි ඉදිරිපත් කරන ලෙස වරිපනම් ගෙවන්නවුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එස ඔප්පුවුවහොත් එම දේපල විකිණීමෙන් නිදසස් කරනු ලැබේ. එවැනි කුවිතාන්සි අඩුම වශයෙන් වෙන්දේසි කිරීමේ නියමිත දිනට දවස් දෙකකට කලින් මෙම කායර්‍යාලය වෙත ඉදිරිපත් කළ යුතුයි. එදිනට පසු ඉදිරිපත් කරන කුවිතාන්සි භාරගනු නො ලැබේ.

සුළු නගර සභා කායර්‍යාලය,
පොල්ගහවෙල,
1960 ඔක්තෝබර් මස 14 වෙනිද.

සභාපති තැන.

### උප ලේඛනය

විකුණන දිනය : 1960 දෙසැම්බර් මස 6 වෙනි අඟහරුවාද

කොට්ඨාශ අංක : 1

කෑගල්ල පාර : අංක 179, 257/5 සහ 257/6.
කුලිපිටිය පාර : අංක 47/1 සහ 47/5.

කොට්ඨාශ අංක : 2

කෑගල්ල පාර : අංක 148, 180/32, 182/7 සහ 186.

1960 දෙසැම්බර් මස 7 වෙනි බදාදා

කොට්ඨාශ අංක : 2

කෑගල්ල පාර : අංක 186/8, 238, 262, 264, 266, 266/1, 268, 270, 270/2, 270 ඒ, 274, 280/10 සහ 288.

1960 දෙසැම්බර් මස 8 වෙනි බ්‍රහස්පතින්දා

කොට්ඨාශය අංක : 2

ඕරුලියද්ද පාර : අංක 19, 23, 29/1, 29/2, 4, 18 සහ 22.
අමේ පාර : අංක 35/15 සහ 35/16.

1960 දෙසැම්බර් මස 9 වෙනි සිකුරාදා

කොට්ඨාශය අංක : 2

පුහුරිය පාර : අංක 41, 43, 45, 45/3 සහ 101.

කොට්ඨාශය අංක : 3

අලව්ව පාර : අංක 85, 87, 97, 99, 109/1.

1960 දෙසැම්බර් මස 13 වෙනි අඟහරුවාද

කොට්ඨාශය අංක : 3

අලව්ව පාර : අංක 96, 102/1, 104 සහ 178/3.
කෑගල්ල පාර : අංක 14, 18, 64/5 ඒ 76/6, 76/14 සහ 76/16.

1960 දෙසැම්බර් මස 14 වෙනි බදාදා

පුහුරිය පාර : අංක 74/2, 90/5, 90/13, 90/20, 98, 108 සහ 108/6.

කොට්ඨාශය අංක : 4

කෑගල්ල පාර : අංක 73, 77, 79, 79/1, 79/2.
කුරුණෑගල පාර : අංක 45 සහ 22/1.
විදුලි මෝල පාර : අංක 22, 26/6, 26/7.

1960 දෙසැම්බර් මස 15 වෙනි බ්‍රහස්පතින්දා

කොට්ඨාශ අංක : 5

ආණ්ඩුවේ ආරෝග්‍යශාලා පාර : අංක 15/2.
කුරුණෑගල පාර : අංක 44/1.
මඩලගම පාර : අංක 10/2 සහ 16/3.
විදුලි මෝල පාර : අංක 24/35, 24/39, 24/54, 24/61, 24/65 සහ 24/71.

1960 දෙසැම්බර් මස 16 වෙනි සිකුරාදා

විදුලි මෝල පාර : අංක 24/75, 24/89, 24/90, 24/94, 24/95, 24/99 32/8, 32/39, සහ 32/40.

1960 දෙසැම්බර් මස 20 වෙනි අඟහරුවාද

කොට්ඨාශ අංක : 6

කුරුණෑගල පාර : අංක 106/1, 110/7, 110/9 , 110/10, 136, 138, 176/1, 176/3, 105/2 සහ 137/1.

1960 දෙසැම්බර් මස 21 වෙනි බදාදා

කුරුණෑගල පාර : අංක 149, 203, 219/1, 221/1, 233/4, 233/5, 233/6, 202, 204, 206.

1960 දෙසැම්බර් මස 22 වෙනි බ්‍රහස්පතින්දා

කුරුණෑගල පාර : අංක 210, 250 සහ 284.
උඩපොල පාර : අංක 1 සහ 30.

10–725

# විවිධ දැන්වීම්

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ තඹරොඹුව ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1961 වර්ෂයට බල පත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බල පත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කයේ තඹරොඹුව ගම්කායයී සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණු නිසායැයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට දහ හතර දිනක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම්දෙමි.

#### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1, යූ. ඇම්. යාකුබ්, නිකවැරටිය. | කණුකැටිය, හරක් මස් විකිණීම. |

එච්. ඇම්. රත්නායක,
තඹරොඹුව ගම්කායයී සභාවේ සභාපති.

1960 ඔක්තෝබර් මස 18 වැනි දින,
මොන්නැකුලමේ පිහිටි
තඹරොඹුව ගම්කායයී සභා කායයීාලයේදීය.

10-679

---

## උඩුනුවර කඳුපළාත ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උප ලෙඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානවල 1961 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (201 වැනි පරිච්ඡේදයේ), 1947 අංක 44 දරණ සංශොධිත ආඥපනතේ 6 වැනි වගන්තියෙන් සංශොධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුපළාත ගම්කායයීසභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහහතර දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

#### උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. වී. ඒ. හමීදු, කුරුකුත්තල, කඩුගන්නාව | කුරුතුත්තල, ගල් පිහිල්ල වත්ත | හරක්මස් |
| 2. උඵනා ඊනා අසන්, ලෙබ්බෙ, වටදෙනිය, වෙළම්බොඩ | වටදෙනිය, අටලහ තැන්න | එම |
| 3. ඊ. ඇම්. රජ්ෂීඩ්, වටදෙනිය, වෙළම්බොඩ | වෙළම්බොඩ, හදිරම | එම |
| 4. අයි. ඇල්. ඇම්. ලෙබ්බෙ, වෙළම්බොඩ | වෙළම්බොඩ, ගල් මුල්ලේවත්ත | එම |

යූ. ඇල්. නූර්මොහමඩ්,
ගම්කායයීසභාවේ සභාපති තැන.

1960.10.20.
උඩුනුවර කඳුපළාත ගම්සභා කායයීාලය,
වෙළම්බොඩ.

10-782

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් මස් විකිණීම පිණිස 1961 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්කායයී සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම '' ගැසට් පත්‍රයේ '' පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත යටතේ 201 වැනි පරිච්ඡෙදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධනයවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඊ. ආර්. කොටිකාවත්ත, පිදුරුවැල්ල, උහුමීය ... ... | ... හරක් මස් | ... පිදුරුවැල්ල හන්දිය, පිදුරුවැල්ල |
| 2. ඒ. ජෙයිනුදීන්, 304, තෙලියගොන්න, නුවර පාර, කුරුණෑගල ... | ... හරක් මස් | ... අංක 63, වදකඩ පාර, පොතුහැර |
| 3. ඇස්. ඒ. රසාක්, අංක 113, මල්ලවපිටිය, නුවර පාර, කුරුණෑගල | ... හරක් මස් | ... අංක 90, ඉහල දිග්ගලවත්ත, පොල්ගහ වෙල පාර, පොතුහැර |

ඩී. කළුහෙන්දිවල,
පොතුහැර ගම්කායයී සභාවේ සභාපති තැන.

ගම්සභා කායයීාලය,
මහපිටිය, පොතුහැර,
20.10.1960.

10–775

---

## දෙහිගම්පල් කෝර්ලේ සහ පහත බුලත්ගම ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1961 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම ගම්කායයී සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහා යැයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ, 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

එච්. ජී. සෝමබන්ධු,
දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම
ගම්කායයී සභාවේ වැඩ බලන ප්‍රධාන තැන.

1960 ඔක්තෝබර් මස 20 වැනි දින,
රුවන්වැල්ල ගම්කායයී සභා කායයීාලයේදීය.

## උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | කේ. ඇම්. අබ්දුල් කාදර් | බුලත්කොහුපිටිය, ගිනිවලපිටිය, අංක41 | හරක් මස් |
| 2. | ඇම්. ඇම්. මකීන් | මත්තමගොඩ, මඩිතියගහමුලහේන, අංක 41 | හරක් මස් |
| 3. | ටී. ඇම්. ඕ. යූසුෆ් | රුවන්වැල්ල, සියඹලාගහකොටුවෙ වත්ත, අංක 72 | හරක් මස් සහ එළු මස් |
| 4. | ඇස්. ඇල්. ඇම්. සෙයිනුදීන් | රුවන්වැල්ල, රත්තනකොටුවෙ වත්ත, අංක 64 | හරක් මස් සහ එළු මස් |
| 5. | ඇස්. ඇල්. ඇම්. සෙයිනුදීන් | කන්නත්තොට, ගල්පොත්තෙ පැලවත්ත | හරක් මස් සහ එළු මස් |
| 6. | ඇස්. ඇල්. ඇම්. සෙයිනුදීන් | අඟුරුවැල්ල, අඟුරුවැල්ලෙවත්ත | හරක් මස් සහ එළු මස් |
| 7. | ඇස්. ඇම්. හසන් | යටියන්තොට මාර්කට්, අංක 1 එළු මස් කඩය | එළු මස් |
| 8. | පී. ඒ. වාප්පු | යටියන්තොට මාර්කට්, අංක 2 එළු මස් කඩය | එළු මස් |
| 9. | ඇන්. පී. විමලසේන | යටියන්තොට මාර්කට්, අංක 1 හරක් මස් කඩය | හරක් මස් |
| 10. | ඒ. පිච්චෙ | යටියන්තොට මාර්කට්, අංක 2 හරක් මස් කඩය | හරක් මස් |

10–757

## නාරම්මල ගම්ප්‍රදේශයේ ගම්කායභා සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන් හි 1960 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන නාරම්මල ගම්කායභා සභා සීමාව තුළ පදිංචි යම්කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යනවග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට්පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දනුම්දෙමි.

## උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | ඇස්. ඩී. ඇම්. ඉස්මයිල්, 130, පුත්තලම්පාර, කුරුණෑගල | පොලිසියවත්ත නො හොත් පොලේ වත්ත-නාරම්මල | හරක්මස්, එළුමස් සහ කුකුල්මස් |
| 2. | ඒ. ඇල්. ඇම්. සේගු මොහම්මදු අලියාර්, සියඹලාගස්කොටුව, නාරම්මල | අංක 5/29, තිඹිරිගහ රුප්පෙවත්ත-නාරම්මල | හරක්මස්, එළුමස් සහ කුකුල්මස් |

පී. බී. මැදගොඩ,
නාරම්මල ගම්කායභාසභාවේ ප්‍රධානතැන.

ගම්කායභාසභා කාර්‍යාලයය,
නාරම්මල, 1960 ඔක්තෝබර් 21.
10-804

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.